සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,379 - 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා - 2024.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 392 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 393 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## එරාවූර් නගර සභාව

2023 වසර සඳහා අවසාන ගිණුම් සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

1939 නගර සභා ආඥාපනතේ 255 පරිච්ඡේදයේ 177 වැනි වගන්තිය අනුව සකස් කරන ලද 2023 අවසන් ගිණුම් 2024.02.09 වැනි මූල්‍ය කමිටු රැස්වීමට ඉදිරිපත් කළ බව මහජනතාවට දැනුම් දීමට කැමැත්තෙමි. ඒවා ඒකමතිකව සම්මත කර ඇති අතර EUC/ FCM/2024-Feb/13 යෝජනාව මගින් අනුමත කරන ලදී. මීට අමතරව, පහත සඳහන් චක්‍රලේඛ අංක 2/2020 සකස් කරන ලද 2023 වාර්ෂික කාර්යය සාධන වාර්තාව, අපගේ සභා පිළිගැනීමේ කවුන්ටරය, මහජන පුස්තකාලය, විවේකානන්ත මහජන පුස්තකාලය සහ අපගේ නිල වෙබ් අඩවියෙන් 2024.01.01 දින සිට නැරඹිය හැකිය.

සාමාන්‍ය කාර්යාල වේලාවන්හි දී එරාවූර් නගර සභාවේ නිලධාරීන්ගෙන් අමතර තොරතුරු ලබා ගත හැක.

එම්. එච්. එම්. හමීම්,
ලේකම්,
එරාවූර් නගර සභාව,
එරාවූර්.

දුරකථන අංකය : 0652240486.

04-13

---

## මාතලේ ප්‍රාදේශීය සභාව

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මාතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේ ජනවාරි මස 23 වැනි දින මාතලේ ප්‍රාදේශීය සභාවේ දී පවත්වන ලද කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 2.4 සහ 2.8 නිර්දේශ යටතේ පහත දැක්වෙන තීරණ මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එම්. ටී. බී. හීන්කෙන්ද,
ලේකම්,
මාතලේ ප්‍රාදේශීය සභාව.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 03 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2024 වර්ෂය සඳහා ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අය වෙනුවෙන් බලපත්‍ර ලබා දීම පිළිබඳ විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අය විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ද සිට දින 14 ක් ඇතුළත මාතලේ ප්‍රාදේශීය සභාව වෙත දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ 7(2) වගන්තිය ප්‍රකාරව මාතලේ ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සත්ව ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *සත්ව වර්ගය* |
|---|---|---|
| එස්. එච්. මොහොමඩ්,<br>අංක 94, ජෝර්ජ් සිල්වා මාවත, මහනුවර | අංක 109 ඒ, හතමුනගාල,<br>කැටවල | ගව |
| ආර්. එස්. එම්. ද සිල්වා,<br>ලොක්නගර්වත්ත, කෝන්ගහමුල,<br>පළාපත්වල. | ලොක්නගර්වත්ත,<br>කෝන්ගහමුල, පළාපත්වල | ඌරු |

04-09

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**කටුවන ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා සේවා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තියට අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කටුවන ප්‍රදේශීය සභාවේ 2024 වර්ෂයට අදාළව පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු අය කිරීම සංශෝධනය කිරීමට 2024 පෙබරවාරි මස 07 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශ අංක 14 යටතේ ලද නිර්දේශයට අනුව 2024 පෙබරවාරි මස 07 දින තීරණ අංක 2024/02/07/77 යටතේ පහත සඳහන් තීරණය ගනු ලැබූ බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. එන්. ජයසේකර,
ලේකම්,
කටුවන ප්‍රාදේශීය සභාව.

2024 මාර්තු මස 20 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කටුවන ප්‍රාදේශීය සභාව මගින් සිදු කරනු ලබන විවිධ සේවා සැපයීම සම්බන්ධව 2024 වර්ෂයට සේවා ගාස්තු අය කිරීම සම්බන්ධව 2023.12.01 දිනැති අංක 2361 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV ආ වැනි කොටස - පළාත් පාලනය යටතේ *ගැසට් පත්‍රයෙ* හි පළකරන ලද අතර, එහි අනෙකුත් සේවා ගාස්තු එසේම තිබිය දී පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු අය කිරීම පමණක් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ගාස්තු 2024.04.01. දින සිට අය කිරීමට මා විසින් තීරණය කරමි.

***උපලේඛනය***

පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු - එක් පොතකට (දිනකට) - රු. 0.50

04-57

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| අප්‍රේල් | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.